# ප්‍රධාන ලේකම් කාර්යාලය,දකුණු පළාත.
# උපාය මාර්ගික ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන
# අභිලාශය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි (REOI)

රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව දකුණු පළාත් සභාව විසින් පුනර්ජනනීය සූර්ය බලශක්ති උත්පාදනයකර,ජාතික විදුලි පද්ධතියට 50 MWක විදුලි ධාරිතාවක් එක් කිරීමේ අරමුණ හා පළාත් සභාව තුළ නව ආදායම් මාර්ග හඳුනා ගැනීමේ අරමුණ පෙරදැරිව,දකුණු පළාත් සභාව තුළ ස්ථාපිත පාසල්,රෝහල් හා රජයේ ගොඩනැගිලිවල වහලවල් දිගුකාලීන බදු පදනමට ලබා දෙමින් සූර්ය බලශක්තිය උත්පාදනයකර විදුලිය ජනනය කිරීමේ කාර්යය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර,සැලසුම් කිරීම,ස්ථාපනය කිරීම,ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව සඳහා සුදුසුකම් ලත් හා උනන්දුවක් දක්වන ආයෝජකයින්ගෙන් (ආයතන හා පුද්ගලයින්ගෙන්) අභිලාශ ප්‍රකාශ කිරීම සඳහා (Expression of Interest) ආරාධනා කරනු ලැබේ.

02.ඒ සඳහා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් සහිත,ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි හෝ නිර්දේශිත ආයෝජකයින්ට ( ආයතන සහ පුද්ගලයින්ට ) ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ හැකි අතර ඒ සඳහා **රු. 3,000.00**ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා ව්‍යාපෘතිය සඳහා විස්තරාත්මක යොමු කිරීමේ අනුදේශ (Terms Of Reference/TOR) සහ අනෙකුත් ලේඛන **2022.02.14 සිට 2022.03.21** දින දක්වා සතියේ වැඩ කරන දිනවල **පෙ:ව: 9.00 සිට ප:ව 3:00** දක්වා ගාල්ල,එස්.එච් දහනායක මාවතේ පිහිටි ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැපයුම් අංශයෙන් ලබා ගත හැකිය.

03.ව්‍යාපෘති යෝජනාව සමග ඉදිරිපත් කරනු ලබන යෝජනා සුරක්ෂණය (ලංසු සුරක්ෂණය) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ලියාපදිංචි ඕනෑම බැංකුවකින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් නමට ලබාගත් **2022.06.22 දින දක්වා වලංගු රු.100,000.00**ක යෝජනා සුරක්ෂණයක් (ලංසු සුරක්ෂණයක්) ඉදිරිපත් කළ යුතුය.

04. ව්‍යාපෘති යෝජනාව 2022.05.20 දක්වා වලංගු විය යුතුය.

05.අභිලාශී යෝජකයින් විසින් අදාළ අභිලාෂය ප්‍රකාශ කිරීම්වල (EOI) හා යොමු කිරීමේ අනුදේශ (TOR) හි නිශ්චිතව දක්වා ඇති තොරතුරු සමග එම කාර්යය ඉටුකිරීම සඳහා තමන් සතු මූල්‍ය හැකියාව, සුදුසුකම් හා පළපුරුද්ද ඇති බවට දැක්වෙන ලේඛනගත සාක්ෂි ද සමග නිසි පරිදි සකස්කර මුද්‍රා තබන ලද අභිලාශ ප්‍රකාශ ලේඛන **2022.03.22 දින පෙ:ව 10:30** ට පෙර ලැබෙන ලෙස **සභාපති, ප්‍රධාන ලේකම් විශේෂ ප්‍රසම්පාදන කමිටුව,දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය,එස්.එච් දහනායක මාවත,ගාල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් රැගෙනවිත් ගණකාධිකාරී (සැපයුම්) නිල කාමරයේ තබා ඇති ලේඛනයේ සටහන් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ යුතු අතර,ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"EOI for procurement of Solar Panel System "** යනුවෙන් සඳහන් කල යුතු වේ.

06.යෝජනා විවෘත කිරීම 2022.03.22 දින පෙ:ව 10:30 ට යෝජනා භාර ගැනීම අවසන් වූ වහාම ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී සිදු කරන අතර එම අවස්ථාවට යෝජනා ඉදිරිපත් කළ ආයෝජකයින්ට හෝ බලයලත් නියෝජිතයෙක් හට සහභාගී විය හැකිය.

07.ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බව සලකන්න.

සැලකිය යුතුයි : අභිලාශී ආයෝජකයින්ට වැඩිදුර තොරතුරු හා පුවත්පත් දැන්වීම දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ www.cs.sp.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

**සභාපති,**
**ප්‍රධාන ලේකම් විශේෂ ප්‍රසම්පාදන කමිටුව,**
**දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**එස්.එච්.දහනායක මාවත,**
**ගාල්ල.**
දිනය : 2021.02.
ෆැක්ස් : 091-2242697
දුරකථන අංක : 091-4944016/091-4946368
ඊ මේල් : supply@cs.sp.gov.lk

CSS/6/9 2022.02

කළමණාකරු,
ආරාධනා ට්‍රේඩර්ස්,
මහවීදිය,
ගාල්ල.

මහත්මයාණනි,

**<u>පුවත්පත් දැන්වීම පළ කිරීම.</u>**

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය උපාය මාර්ගික ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන යටතේ සූර්ය බලශක්ති උත්පාදනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව අභිලාශය ප්‍රකාශ කිරීම සඳහා ආයෝජකයින්ට ආරාධනා කිරීම සඳහා සකස් කරන ලද සිංහල දැන්වීමක් මේ සමග එවමි.

02.මෙම ප්‍රසම්පාදන දැන්වීම දින දිනමිණ හෝ ලංකාදීප,තිනකරන් සහ Daily News යන පුවත්පත්හි පළ කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03.දැන්වීම පළ කිරීමෙන් පසු ගෙවීම් කිරීමට කටයුතු කරන බව වැඩි දුරටත් කාරුණිකව දන්වමි.

මෙයට - විශ්වාසී,

**වසන්ත රණවක,**

ප්‍රධාන ගණකාධිකාරී,

ප්‍රධාන ලේකම් වෙනුවට,

දකුණු පළාත.

CSS/6/9 2022.02

පරිගණක වැඩසටහන් සම්පාදිකා,

පරිගණක අංශය,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

දකුණු පළාත.

**<u>පුවත්පත් දැන්වීම ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියෙහි පළ කිරීම.</u>**

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය උපාය මාර්ගික ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන යටතේ සූර්ය බලශක්ති උත්පාදනයකර,ජාතික විදුලි පද්ධතියට 50MWක විදුලි ධාරිතාවක් එක් කිරීමේ ව්‍යාපෘතියට අදාළව අභිලාශය ප්‍රකාශ කිරීම සඳහා ආයෝජකයින්ට ආරාධනා කිරීම සඳහා කටයුතු සංවිධානයකර ඇත.

02.ඒ අනුව,ඉදිරි කටයුතු සඳහා සකස් කරන ලද පුවත්පත් දැන්වීම ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියෙහි පළ කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස මෙමගින් කාරුණිකව දන්වා සිටිමි.

**වසන්ත රණවක,**

ප්‍රධාන ගණකාධිකාරී,

ප්‍රධාන ලේකම් වෙනුවට,

දකුණු පළාත.